**08**

# යුද කටයුතු සංවිධානය කිරීමේදී රෝහණ රාජ්‍යය දැක්වූ දායකත්වයපිළිබඳ විමර්ශනයක්

ජේ. සුදර්මා ප්‍රේමසිරි

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ ප්‍රාදේශීය පාලන ඒකකයක් වශයෙන් පැවති රෝහණ රාජ්‍යයට හිමි වන්නේ සුවිශේෂී වූ ස්ථානයකි. රජරට ශිෂ්ටාචාරයට සමකාලීන ව රෝහණයෙහි ද ජනාවාස ආරම්භ වීම සිදු විය. පොළොන්නරු රාජධානි සමය දක්වා කාල පරාසය තුළ මෙම අධ්‍යයනය සිදු කෙරේ. ආර්යයන්ගේ පැමිණීමෙන් ලක්දිව වයඹ හා ගිනිකොණදිග ප්‍රදේශයන්හි මුල් කාලීන ව ජනාවාස ආරම්භ විනැ යි යන මහාවංස පුවතට අනුව ලක්දිව ජනාවාස ව්‍යාප්තියේ ආරම්භයත් සමග දකුණු ප්‍රදේශයේ ද ජනාවාස වන්නට ඇති බව ප්‍රත්‍යක්ෂ කරුණකි. ඒ අනුව ඉන්දියාවේ සිට සංක්‍රමණය වූ ජන කොටස්වලින් පැවත ආ පිරිස් මහවැලි ගඟ ඔස්සේ විහිදී ගොස් රුහුණේ පදිංචි වූ බව කිව හැකි ය.

අනුරාධපුර රාජධානි සමය වන විට සබඳතා වර්ධනය කර ගනිමින් දියුණු ප්‍රාදේශීය පාලන ඒකකයක් ලෙස රෝහණ රාජ්‍යය ඉදිරියට ගමන් කරන්නට ඇතැයි සිතිය හැකි ය. එකල ලක්දිව දේශපාලනමය වශයෙන් ව්‍යාකූල තත්ත්වයක් දැකගත හැකි ය. රජරට රාජ්‍යය දේශපාලනමය වශයෙන් භේද භින්න වී සතුරු ආක්‍රමණවලට භාජනය වී විදේශිකයන් අතට පත් වූ සෑම අවස්ථාවකදී ම පාහේ එකී උවදුරුවලින් රාජ්‍යය මුදා ගැනීමට රෝහණය වැදගත් වූ අවස්ථා ඉතිහාසගත තොරතුරු මගින් හඳුනාගත හැකි ය. මෙහිදී දුට්ඨගාමිණී රජුගේ නායකත්වයෙන් ප්‍රාදේශීයව පැවති පාලන ඒකක එක්සත් කරමින් අනුරාධපුරය මුල් කරගෙන එක්සත් පාලන සංවිධානයක් ඇති කිරීම පුරාතන ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ කැපී පෙනෙන අවස්ථාවක් ලෙස පෙන්වාදිය හැකිය. ආක්‍රමණ අවස්ථාවලදී රජුන් ඇතුළු ප්‍රභූ පිරිස් ආරක්ෂාව පතා පළා ගියේ රෝහණ ප්‍රදේශය වෙතය.

මෙහිදී ශ්‍රී ලංකා ඉතිහාසය ගත් විට යුද කටයුතු සංවිධානය කිරීම සඳහා රෝහණය දායක කර ගැනීමට පසුබිම් වූ රෝහණ රාජ්‍යයේ සුවිශේෂීතාවය කෙබඳු ස්වරූපයක් ගත්තා ද යන කාරණය පිළිබඳ ව විමසා බැලීම මෙන්ම එහිදී සිදු කළ යුද සංවිධාන කටයුතු පිළිබඳව ද

විමසා බැලීම මෙහි අරමුණ විය. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි. රෝහණයේ පැවති ඓතිහාසික වටිනාකමත්, ආරක්ෂිත පරිසරයත්, එහි පැවති සමෘද්ධිමත්භාවයත්, ශ්‍රේෂ්ඨ රජවරුන් බිහිවීමත්, රජරට ශිෂ්ටාචාරයට සමගාමී ව රෝහණයේ ද ක්‍රමවත් පාලන රටාවක් පැවතීමත් යනාදි කරුණු, අරමුණ සාක්ෂාත් කර ගැනීමට ඉවහල් කර ගත් කරුණු කිහිපයකි. දේශීය රජවරුන්ගේ දේශපාලන කටයුතු සඳහා අවශ්‍ය වූ භූගෝලීය සාධක මෙන් ම භෞතික සාධක ද රෝහණ රාජ්‍යය සතු ව පැවති බව මෙන්ම යුද කටයුතු සංවිධානය කිරීමේදී සුවිශාල වූ දායකත්වයක් රෝහණයෙන් හිමි වූ බව නිගමනය කෙරිණි.

ප්‍රමුඛ පද- රෝහණ රාජ්‍යය, යුද කටයුතු, රජරට ශිෂ්ටාචාරය, දේශපාලන බලය

## අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමෙහිලා ඉතා වැදගත් වූ කාර්යභාර්යක් රෝහණ රාජ්‍යය මගින් ඉටු වූ බව කිව හැකි කරුණකි. ලංකා ඉතිහාසය තුළ ප්‍රාදේශිය පාලන ඒකකයක් වශයෙන් පැවති රෝහණ රාජ්‍යයට හිමි වන්නේ සුවිශේෂී වූ ස්ථානයකි. රජරට රාජ්‍යය දේශපාලනමය වශයෙන් භේද භින්න වී සතුරු ආක්‍රමණවලට භාජනය වී එම රාජ්‍යය විදේශිකයන් අතට පත් වූ සෑම අවස්ථාවකදීම පාහේ එකී උවදුරුවලින් රාජ්‍යය මුදා ගැනීමට රෝහණ රාජ්‍යය වැදගත් වූ අවස්ථා ඉතිහාසගත තොරතුරු මඟින් හඳුනාගත හැකිය.

මේ ආකාරයට දුට්ඨගාමිණී රජුගේ නායකත්වයෙන් ප්‍රාදේශිය පාලන ඒකක එක්සත් කරමින් අනුරාධපුර රාජ්‍යය මුල් කරගත් එක්සත් පාලන සංවිධානයක් ඇති කිරිම ලංකා දේශපාලන ඉතිහාසය තුළ කැපි පෙනෙන අවස්ථාවක් වශයෙන් හඳුනාගත හැකිය. එසේම ආක්‍රමණ අවස්ථාවලදී ද රජුන් ඇතුළු ප්‍රභූ පිරිස් තම ආරක්ෂාව පතා පළා ගියේ රෝහණ ප්‍රදේශය වෙතටය. ලංකා ඉතිහාසය ගත් විට යුද කටයුතු සංවිධානය කිරිම සඳහා රෝහණ රාජ්‍යය දායක කර ගැනිමට පසුබිම් වූ රෝහණ රාජ්‍යයේ සුවිශේෂිතාවය කෙබඳු ස්වරූපයක් ගත්තාද, යන කාරණය පිළිබඳව මෙන්ම එහිදි සිදු කළ යුද සංවිධාන කටයුතු පිළිබඳව ද විමසා බැලිම මෙහි අරමුණ වේ.

රෝහණ රාජ්‍යය විවිධාකාර නාමයන්ගෙන් හඳුන්වා ඇති බව පෙනෙ සීහළවත්ථුප්පකරණයට අනුව හා සහස්සවත්ථුප්පකරණයට අනුව රෝහණය හඳුන්වා ඇත්තේ ''රෝහණ ජනපද'' යන නමිනි (සී.ව, පි. 10) වංසත්ථප්පකාසිනියෙහි ද ''රෝහණ ජනපද'' වශයෙන් රෝහණය හඳුන්වා ඇති අතර ඊට අමතරව ''රෝහණ දේස, රෝහණ දිසා, රෝහණ පදේස යන නාමයන් ද එම රාජ්‍ය හැඳින්වීම සඳහා යොදා ගෙන ඇත (වංස, පි. 243). එසේම මහාවංසයෙහි ද රෝහණ රාජ්‍යය හඳුන්වා ඇත්තේ ''රෝහණ'' යන නාමයෙනි (ම.ව. 22 : 8). අනුරාධපුර යුගයට හා පොළොන්නරු යුගයට අයත් සෙල්ලිපිවල රෝහණ රාජ්‍යය හඳුන්වා ඇත්තේ ''රෝහණ, රුහුණ් දනවු හෝ රුහුණු දනවු'' යන නම් වලිනි (IC, Vol II, p. 74).

එමෙන්ම නිශ්ශංකමල්ල රජුගේ රම්බා විහාර පුවරු ලිපියට අනුව මෙකී රාජ්‍යය හැඳින්වීම සඳහා යොදාගෙන ඇත්තේ ''රුණු රජය'' යන නාමයයි (EZ, Vol III, pp.328). රෝහණ ජනපදය ශ්‍රී ලංකාවේ බිහි වූ මුල් ම ආර්ය ජනාවාස ඇතුරෙන් එකක් ක්‍රි.පූ. 06 වන සියවසේදී පමණ නැගෙනහිර ඉන්දියාවේ සිට මෙහි පැමිණි ''රෝහණ'' නම් ක්ෂත්‍රිය කුමාරයෙකු විසින් පිහිටුවා ගත් බව මහාවංසයේ සඳහන් වේ (ම.ව. 09 : 6-10). වංසකතාවට අනුව අනුරාධපුර, උපතිස්සගාම, උරුවෙල්ගාම, විජිතපුර, ආදි වූ මුල් ආර්ය ජනාවාස කදම්බ නදී (මල්වතු ඔය), ගම්භීර නදී (කණදරාඔය) හා ගංගානදී ආදි වූ ගංගා අසබඩය (ම.ව. 07 : 43). ඒ අනුව එම ජනාවාස බිහි වූ කාලයේදීම පිහිටුවා ගනු ලැබූ රෝහණ ජනපදය ද ඒ අසල වූ කිසියම් ගංගාවක් අසබඩ පිහිටුවා ගන්නට ඇතැයි සිතිය හැකිය.

රෝහණ රාජ්‍යයෙහි ආරම්භය පිළිබඳව විමසා බැලීමේදී මහානාග කුමරු හා සම්බන්ධ වු කතා පුවතක් සමග මෙය සම්බන්ධ වේ. රෝහණය වෙනම ප්‍රාදේශීය රාජ්‍යයක් වශයෙන් සලකනු ලබන්නේ දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍යය සමයේ දී ඔහුගේ කනිටු සොහොයුරෙකු හා යුව රජු වූ උපරාජ මහානාග කුමරු එහි ගොස් පාලකයා බවට පත් විමෙන් පසුවය. වංසකතාවට අනුව ද රෝහණ රාජ්‍යයේ ප්‍රථම පාලකයා වශයෙන් සැලකෙන්නේ උපරාජ මහානාග කුමරුය (ම.ව. 02 : 8). ඔහු ස්වාධීන පාලකයෙකු වශයෙන් රෝහණ රාජ්‍යයෙහි පාලනය ගෙන ගියේය.

මෙලෙස ආරම්භ වූ රෝහණ රාජ්‍යයට අයත්ව පැවති ප්‍රදේශවල පිහිටීම හා එහි ලක්ෂණ මෙහි රාජ්‍යය සියවස් 15 ක් පමණ වූ දීර්ඝ කාල පරිච්ඡේදයක් මුළුල්ලේ වෙනම ප්‍රාදේශීය රාජ්‍යයක් වශයෙන් පවත්වාගෙන යාමට එහි පාලකයන්ට උපකාරී විය. භූගෝලීය වශයෙන් වෙන් වී හුදෙකලාව නැගී සිටි ඒකීය රාජ්‍යයක් වශයෙන් එය පවත්වාගෙන යාමෙහිලා මෙකී සාධක බොහෝ සෙයින් උපකාරී වූ බව නිසැකය. රෝහණ රාජ්‍යයේ ආරක්ෂිත ස්ථානයක් වශයෙන් පැවතීම එහි පැවති සුවිශේෂිතාවය පිළිබඳව කතා කිරීමේදී මෙහි ගිරි දුර්ග, වන දුර්ග, ජල දුර්ග ආදි ස්ථානවලින් ගහන වීම සුවිශේෂිය.

මෙහි මහවැලි, වලවේ හා කිරිඳි යන ගංගා නිම්නවල නුවරගල් කන්ද, කතරගම කන්ද, ගෝවින් දහෙළ, ගංදෙනිය ආදි වූ ගිරි දුර්ග කිහිපයක්ම පිහිටා ඇත. මෙම ගිරි දුර්ග පර සතුරු උවදුරුවලින් ආරක්ෂා වීම සඳහා රුහුණේ ඇතැම් පාලකයන් විසින් ප්‍රයෝජනයට ගෙන ඇත. එමෙන්ම විදේශිය ආක්‍රමණයන් හෝ අභ්‍යන්තර කුමන්ත්‍රණ පැන නැගී අවස්ථාවලදී අනුරාධපුර රාජ්‍යයෙහි වූ රජවරුන්ට රෝහණය අභය ස්ථානයක් වශයෙන් ප්‍රයෝජනවත් විය. තුන්වන උදය රජුගේ පාලන කාලයේදී තපෝවන සිද්ධිය මූලික කරගෙන රජුට රාජ්‍යය විරෝධී කැරැල්ලකට මුහුණ දීමට සිදු වූ අතර මෙහිදී ආරක්ෂාව පතා රජු, යුවරජු හා ආදිපාදවරු රෝහණයට පලා ගියේය. කැරැල්ල නිමාවට පත් වූයේ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් අනතුරුවය (ම.ව. 53 : 13-23).

එමෙන්ම IVවන උදය රජුගේ පාලන කාලය තුළ දී ද ආරක්ෂාව පතා මෙරට තබා ගිය පාණ්ඩ්‍ය රජුගේ කකුධ භාණ්ඩ නැවත ලබා ගැනීමේ අරමුණින් සොළී රජෙකු විසින් මෙරට ආක්‍රමණය කරනු ලැබීය. එහිදී උදය රජු පාණ්ඩ්‍ය කකුධ භාණ්ඩ ද රැගෙන ආරක්ෂාව පතා පලා ගියේ රෝහණ දේශය වෙතය (ම.ව. 53 : 39-45). උදය රජු රුහුණට පලා ගිය අවස්ථාවේදී ඔහු අල්ලා ගැනීම සඳහා ඔහු පසුපස ලුහුබැඳ ගිය සොළී බලසෙන් එහි පැවති භූගෝලීය දුෂ්කරතා හා බාධක මැඩගෙන එහි යාමට මඟක් නොවුයෙන් පෙරළා සිය රටට ගිය බව වංසකතාවේ සඳහනින් මේ කරුණ සනාථ වේ.

(ම.ව. 53 : 41-45). V මිහිඳු රජුගේ 10 වන රාජ්‍ය වර්ෂයේදී පැන නැගී අගම්පඩි හමුදා කැරැල්ලක් හේතුවෙන් රජුට රෝහණයට පලා යෑමට සිදු

විය. චෝළ සේනාවක් රජු පසුපස ලුහුබැඳ ගිය ද රෝහණයට ඇතුළුවීමට මඟ සොයාගත නොහැකිව පසු බැසිය (ම.ව. 55 : 07-15). එපමණක් නොව වට්ටගාමිනි අභය රජු, ධාතුසේන යන රජවරු මෙන් ම V සේන රජුට ද ඔහුගේ සෙනෙවියා අතර ඇතිවූ ගැටුමක් නිසා අනුරාධපුරයෙන් ආරක්ෂාව පතා පළා යෑමට සිදු වූයේ රෝහණ ප්‍රදේශය වෙතය. මෙලෙස රට අභ්‍යන්තරයේ ඇති වූ ගැටුම්, කලකෝළහල අවස්ථාවලදී ද රෝහණය රජවරුන්ට අභය ස්ථානයක් වශයෙන් වැදගත් විය.

ලංකා ඉතිහාසය තුළ ආරම්භක යුගයේ පටන්ම රජරට ප්‍රදේශය විදේශීය ආක්‍රමණ කිහිපයකට භාජනය වූ අතර එවැනි අවස්ථා කිහිපයකදීම ආක්‍රමණිකයන්ට ලංකාවේ උතුරු ප්‍රදේශය අත්පත් කොටගෙන ඔවුන්ගේ අණසක එහි පිහිටුවා ගැනිමට හැකි විය. එහෙත් කිසිදු අවස්ථාවක ඔවුන්ට රෝහණ රාජ්‍යය ආක්‍රමණය කොට ජයගත නොහැකි විය. එයට ප්‍රධාන වශයෙන් බලපෑ සාධකය වූයේ එහි පැවති භූගෝලීය පිහිටීමයි. රුහුණේ ස්වාධීනත්වය රැක ගැනීමට ඉවහල් වූ එක් ප්‍රධාන භූගෝලීය සාධකයක් වූයේ එහි ගෝවින්ද මලය, ගංදෙණිය, නිල්ගල, කුඩුම්බිගල, නාමළුවහෙල, කොන්ගල, බඹරගස්තලාව, වඩිනාගල, නෙළුම්පත් පොකුණ, නුවරගල, කරතගම විහාරේගල ආදි වූ ගිරි දුර්ග රාශියක් එහි පිහිටා තිබීමයි. රෝහණ රාජ්‍යය උග්‍ර දුර්ගයක් වශයෙන් වංසකතාව ද එක් තැනකදී හඳුන්වා දී ඇත (ම.ව. 51 : 136). රජරට ප්‍රදේශය ආක්‍රමණිකයන් යටතට පත්ව තිබූ අවස්ථාවල දී ඔවුන්ගෙන් එය මුදා ගැනීම පිණිස සංවිධානය වූ කාලය තුළද රුහුණේ පාලකයන්ට ඒ සඳහා අවශ්‍ය ආරක්ෂාව මෙම උස් ගිරි දුර්ග මඟින් ලැබිණ.

රජරට රාජ්‍යය විදේශිය ආක්‍රමණිකයන් අත්පත් කර ගත් ඇතැම් අවස්ථාවලදි රුහුණට පලා ආ පාලකයන්ට රැකවරණයක් ලබාදීමට රෝහණ රාජ්‍යය වැදගත් වුවා සේම ආක්‍රමණිකයන් මෙරටින් පළවා හැරිම සඳහා සංවිධානය විම පිණිස එහි පැවති ලක්ෂණ හා පිහිටිම මනා සේ වැදගත් විය. ලංකාද්විපය අඩසියවසකට ආසන්න වූ කාලයක් තිස්සේ විදේශීය රජෙකුට යටත්ව පැවති අනුරාධපුර රාජ්‍යය මුදා ගනිමින් ශ්‍රී ලංකාව එක්සත් කිරිමේ මහඟු කර්තව්‍ය ඉටු වන්නේ දුටුගැමුණු රජු අතිනි. එහෙත් මේ සා විශාල වූ කාර්යභාර්ය පසුපස ඔහුගේ පිය වූ කාවන්තිස්ස රජුගේ මැදිහත් විම දක්නට ලැබේ. මහාවංස කතුවරයා කාවන්තිස්ස රජු බියගුළු පාලකයෙකු වශයෙන් පෙන්වා දී

ඇති අතර දුටුගැමුණු මහාවංසයේ වීරයා වශයෙන් දක්වා ඇත. එහෙයින් කාවන්තිස්ස රජු සතු වූ කලෝචිත වුත්, දූරදර්ශිවූත්, ක්‍රියා කලාපය දුටුගැමුණුගේ ජයග්‍රහණය හමුවේ අමතකව ගොස් ඇත. එහෙත් ඊට ජය ගැනිමට අවශ්‍ය සියලු පසුබිම කාවන්තිස්ස රජු නිර්මාණය කරනු ලැබුවේ රෝහණ ප්‍රදේශයේ සිටය. දුටුගැමුණු එවැනි සටන් ව්‍යාපාරයට අවශ්‍ය සියලු ඉදිරි පියවරක්, අඩිතාලම නිර්මාණය වන්නේ රෝහණ දේශයේ මුලිකත්වය මතය.

මෙහිදි රජු ප්‍රථමයෙන්ම එවකට රුහුණේ සහ කැලණියේ වෙන් වී පැවති රාජ්‍යයන් එක්සත් කිරිමට කටයුතු කළේය. ඒ වන විට මාගම, සේරුවිල, සෝම නුවර, ලෝණ නුවර, කතරගම, කැලණිය ආදි වශයෙන් ලංකාව කොටස් ගණනාවකට බෙදි පැවතුණි (කෝණාර ගුණරත්න, 1999, පි. 91). මෙලෙස එක්සත්භාවය ඇති කිරිම සඳහා දේශපාලන විවාහ දෙකක් උපයෝගි කර ගත්තේය. කැලණියේ රජ පවුල අතර කාවන්තිස්ස රජු විවාහයක් කර ගැනිමෙන් ඒ රාජ්‍යයන් තම රාජ්‍යය සම්බන්ධ කර ගත්තේය (පරණවිතාන, සෙනරත්, 1972, පි. 144). කැලණි කුමාරයෙකු හට සහෝදරියක් දී කැලණි රජ පවුලේ කුමාරිකවක් වූ විහාර මහාදේවිය තම මෙහෙසිය කර ගත්තේය (ධා.ව, පි. 30). ගිරි නුවර රජ කිරිමට තම පුත්‍රයා යැවීය (ධා.ව, පි. 32). මෙලෙස රුහුණු එක්සත් කිරීම දුටුගැමුණු රජුගේ ද්‍රවිඩයන් එළවීමේ කාර්යයට සම්පුර්ණයෙන්ම මග හෙළිකිරිමක් වශයෙන් සැළකිය හැකිය. මෙවැනි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි නම් කිසි විටෙකත් දුටුගැමුණුට එළාර වැනි බලවත් ද්‍රවිඩ රජෙකුට විරුද්ධව එවැනි සටනක් කළ නොහැකිය.

අනාගතයේදි ඇතිවන යුද්ධවලදි අවශ්‍ය ආහාර ආදිය සඳහා රට ආර්ථික වශයෙන් සුභික්ෂිත කිරිමට ක්‍රියා කළේය. මේ සඳහා රජු දීඝවාපියේ ගොවිතැන් කටයුතු දියුණු කිරිම සඳහා සද්ධාතිස්ස කුමරු යැවීය (ම.ව., 24:57-58). දුටුගැමුණු රජු ද්‍රවිඩයන් හා යුද්ධ කිරීමේදී ප්‍රධාන යුද්ධ මධ්‍යස්ථානය වශයෙන් ද තෝරගනු ලැබුවේ දීඝවාපියයි. මේ අනුව කාවන්තිස්ස රජුගේ ආර්ථික ප්‍රතිපත්තිය ද දුටුගැමුණු රජුගේ රජරට ජයග්‍රහණයට බොහෝ සෙයින් උපකාරි වූ බව පෙනේ.

එමෙන්ම යුද උපකරණ නිෂ්පාදනය හා සේනා සංවිධානය කිරිමට ද කාවන්තිස්ස රජු නොයෙකුත් ක්‍රියාමාර්ග ගනු ලැබීය. රජු හමුදා සංවිධානය කිරිම පිළිබඳව මහාවංස කතෘ තොරතුරු දක්වා ඇත්තේ,

"......දික්පති රජතෙමේ මහා යෝධයක් දස දෙනා කැඳවා තෙපි එක එකා යෝධයන් දසදෙනා සොයව් යි කීවේය. ඔහු එසේම යෝධයන් ගෙනාවෝය........" යනුවෙනි (ම.ව., 23:97-100).

මෙලෙස ශක්තිමත් හමුදාවක් එකතු කර ගැනීමෙන් පමණක් නොතැවතුණු රජු යුද්ධය සඳහා අවශ්‍ය අවි ආයුධ නිෂ්පාදනය කලේය. රජු දුනු, කඩු ආදිය තැනීම සඳහා කම්හල් පිහිටුවීය. ආයුධ නිෂ්පාදන කර්මාන්තශාලා මහා පරිමාණයේ ඒවා විය. එහි එක් කර්මාන්තශාලාවක කර්මාන්තකරුවන් 500 ට වඩා පිරිසක් සේවයෙහි නිරත විය (සද්ධර්මාලංකාරය, පි. 469). රජු මහවැලි ගඟ දිගට ආරක්ෂක විධිවිධාන යෙදූ ආකාරය පිළිබඳව තොරතුරු වංසකතාවේ දක්වා ඇත (ම.ව., 23:16-18). එමෙන්ම රජු වැදගත් වූ ස්ථානවල යුද්ධ සේනා නැවැත්වීමෙන් හා බලකොටු සෑදීමෙන් ද ආරක්ෂා කරන ලදී (රාජාවලිය, පි. 36) රෝහණ රාජ්‍යය ආක්‍රමණවලින් ආරක්ෂා කිරීමේ තම දෙවන බිසවගේ පුත්‍රයෙකු වන දීඝාභය කුමරුට පැවරුවේය (ම.ව, 23: 16-18). මෙවන් අඩිතාලමක් දැමීමෙන් පසු දුටුගැමුණු රජු අනුරාධපුර ආක්‍රමණය මෙහෙයවනු ලැබීය. රජු බලසෙන් සහිතව මාගමින් නික්ම ගිය අයුරු විස්තර කරන මහාවංසය,

".........මිහිපල් තෙමේ මාගමින් පිටත්ව මලයරට සිට මෙහි එන (අනුරාධපුර) මාර්ගය සුද්ධ කරවා කඩොලැතු නැගී යෝධයන් විසින් පිරිවරන ලදුයේ මහත් බලසෙන් හා යුද පිණිස නික්ම ගත්තේය........." (ම.ව, 25 : 05-06).

දුටුගැමුණු රජුගේ අනුරාධපුර ආක්‍රමණයය ගැන සඳහන් කරන මහා බෝධිවංසය ඒ බව දක්වා ඇත්තේ,

"............දුට්ඨගාමිණී අභය රජතෙමේ තමාගේ දසමහා යෝධයන් විසින් පරිවරන ලදුව කඩොලැතු පිට නැගී මලය දේශයෙන් අවුත් එළාර නම් දෙමළ රජ්ජුරුවන් හා යුද්ධකොට ජය ගත්තේය.........." යනුවෙනි (මහාබෝධිවංසය, පි. 83).

අනුරාධපුර සටනට සඳහා දුටුගැමුණු රජුගේ බලසේනා මාගම සිට ගුත්තහාලක නම් වූ ස්ථානය දක්වා පැතිර සිටි බව වංසකතාවේ දැක්වේ (ම.ව, 25: 06)

එමෙන්ම විජයබාහු රජුට ද පාලනය ලබා ගැනීමේදී දේශීය සතුරන් විනාශ කොට, රුහුණේ තම බලය පිහිටුවා ගැනීමෙන් නොබෝ කලකට පසුව ද දකුණු ප්‍රදේශය අල්ලා ගැනීමට මාන බලමින් සිටි සොළී

අධිරාජ්‍යයාගෙන් ද වරින් වර එල්ල වූ ආක්‍රමණයන්ට මුහුණදීමට සිදුවිය. රජු රුහුණේ රාජ්‍යය කළ කාලය තුළ දකුණු ඉන්දියාවේ චෝළ අධිරාජ්‍යයාගෙන් එල්ල වූ ප්‍රධාන ආක්‍රමණ තුනකට හා පොළොන්නරු කඳවුරේ සොළී සාමාන්තයාගෙන් එල්ල වූ එක් ආක්‍රමණයකට ද මුහුණදීමට සිදු වූ බව වංසකතාවේ එන තොරතුරුවලින් හෙළිවේ (ම.ව. 58 : 4-14). සතුරු සොළීන්ගෙන් එල්ල වූ ප්‍රහාරවලට අමතරව ස්වදේශික සතුරන්ගෙන් එල්ල වූ ප්‍රහාරවලට එරෙහිව නැගී සිටීමට එතුමාට සිදුවිය. රජු විසින් ශ්‍රී ලංකාව එක්සේසත් කරන් ලැබුවේ බොහෝ දේශීය හා විදේශීය සතුරන් පිටුදැකීමෙන් පසුව බව වේලෙයික්කාර ලිපියේ සදහන් වේ (EZ, Vol II, pp 252-253).

විජයබාහු රජුට මුහුණදීමට සිදු වූ බැරෑරුම් කාර්ය වූයේ රජරට චෝළ ආධිපත්‍යයෙන් මුදවා ගැනීමයි. මේ සඳහා රජුට රෝහණ රාජ්‍යය මගින් ලැබුණේ සුවිශාල වූ දායකත්වයකි. විජයබාහු රජුගේ පාලන ප්‍රදේශය වශයෙන් තෝරාගෙන සිටි කතරගම ප්‍රදේශය විනාශ කිරීමට චෝළ සෙනෙවියා උත්සාහ කළ නමුත් පළමු ප්‍රයත්නය අසාර්ථක විය. නැවතත් මහාතිත්ථ වරායෙන් ගොඩ බට චෝළ සේනාව ඉතා දරුණු ආකාරයට රට වැසියා මර්දනය කරමින් රුහුණට කඩා වැදුණි. මෙහිදී රජු පලුට්ඨගිරියෙහි කඳවුරු බැද ගත්තේය. පසුව සිදු වූ සටනින් චෝළයන් අන්ත පරාජයකට පත් වූ අතර චෝළ සේනාපති බුත්තල (ගුත්තහාලක) ප්‍රදේශයේ පිහිටියා යැයි සැලකෙන තම්බවිට්ඨි නම් ස්ථානයේදී සිංහල සේනා අතින් ජීවිතක්ෂයට පත් විය.
(ම.ව. 58 : 18-20).

විජයබාහු රජු සොළීන්ගෙන් රජරට මුදවා ගැනීම සඳහා දියත් කළ අවසාන සටනේදී ඔහු විසින් දක්ඛිණ දේශය හරහා අනුරාධපුරයට යවනු ලැබූ බල ඇණියට අතරමගදී මුහුන්නරුව, බලතගොඩ, තලගල්ල, මාගල්ල හා මඩගල්ල නම් වූ ස්ථානවල පිහිටුවා ගෙන තිබූ සතුරු බලකොටුවලට එරෙහිව සටන් වැදුණු බව වංසකතාවේ කියවේ (ම.ව. 58 :40-45). මෙහිදී රජු තමාට මීට පෙරදී ආරක්ෂාව සලසා දුන් පලටුපාණ දුර්ගයේ කඳවුරු බැදලා නොගෙන ඔහු සතු සියලු ධනය ගෙනගොස් තම්බලගාම නම් තැන අභිනව දුර්ගයක් පිහිටුවා ගත් බවත්, පසුව මහානාගහුලපුරයට ගොස් එහි වෙසෙමින් සොළීන් හා යුද්ධ කිරීම සඳහා සේනා සංවිධානය කළ බවත් වංසකතාවේ දක්වේ (ම.ව. 58 : 38-39).මෙලෙස රෝහණ ප්‍රදේශයේ සිට සේනා සංවිධානය කර පසුව

චෝළයන් මෙරටින් පළවා හැර තම අග නගරය වශයෙන් පොළොන්නරුව තෝරාගෙන පාලන කටයුතු ගෙනයනු ලැබීය.

මානාභරණ රජුගේ අභාවයෙන් පසු රෝහණ රාජ්‍යය පරාක්‍රමබාහු රජුගේ ආධිපත්‍යය යටතට පත් විය. වංසකතාව අනුව මානාභරණ රජුගේ අභාවයෙන් නොබෝ දිනකට පසුව කැරැල්ලක් ඇති විය. මෙහිදී සුගලා දේවිය ඇතුලු තවත් පිරිසක් රජුට විරුද්ධව ක්‍රියා කරන ලදි. එහිදී

".........බොහෝ දුර්ගස්ථානක් ශක්තිමත් බලකොටු බවට පත් කාට ඒවායේ බල මුලු රදවා ඒවා වටා අගල් බිඳුණු තියුණු කටු අතුරුවා කපා හෙළන ලද වෘක්ෂයන්ගෙන් මාර්ගයෙන් ද..........."

ආදී වශයෙන් දක්වා ඇති අරගලය පිළිබඳව දැන ගත් රජු ඔහුගේ රක්ඛ නම් සේනාපතියා ගෙන්වා රුහුණට ගොස් දාමරිකයන් පලවා හැර ආරක්ෂාව සඳහා රැඳවිය යුතු යුත්තන් රදවා එන ලෙස දන්වා ඔහු එහි යැවූ බව දක්වා ඇත (ම.ව. 74 : 22-39). මෙලෙස වංසකතාවේ සඳහන් වුවද ඒ වන විට රුහුණේ සුගලා බිසව සතුව තිබූ ධාතූන් වහන්සේලා අත්පත් කර ගැනීමේ පරමාර්ථයෙන් රජු විසින් රෝහණ රාජ්‍යයට එරෙහිව කරන ලද යුද්ධයක් බව දක්වන මතයක් ද වේ (රණවැල්ල සිරිමල්, 2003, පි. 188).දළදා පාත්‍රා ධාතූන් වහන්සේලා අත්පත් කර ගැනීමට රක්ඛ සේනාපතියාට හැකි වූ නමුත් එහි රැකවරණය ලබාගෙන සිටි සුගලා බිසව ඒ වන විට එම ප්‍රදේශයෙන් පළා ගොස් අටදහස්රට දුර්ග ස්ථානයක සැඟ වී සිටි හෙයින් ඇය සිර භාරයට ගැනීමට ඔහු අපොහොසත් විය (ම.ව. 75 :154).

වංසකතාවේ එන තොරතුරුවලින් හෙළිවන පරිදි රෝහණ රාජ්‍යය පුරාම පැවති කැරලි සියල්ලක්ම වරින් වර ඇති වූ බව පෙනේ. මෙලෙස ඇති වූ කැරලි කාලයක් පැවතීමට හේතු වූයේ රුහුණේ ස්වාභාවික භූගෝලීය පිහිටීම මගින් කැරලිකරුවන්ට ලබා දුන් රැකවරණයයි. කැරලිකරුවන් කැරලි හමුදාවන්ට පහරදීම සඳහා මෙන්ම සටන්වලින් පැරදී පළා යාමෙන් පසු රැකවරණය ලබා ගැනීම සඳහා ද යොදා ගනු ලැබුවේ තම රාජ්‍යයේ පිහිටා ඇති ගිරි දුර්ග හා ඝන වනාන්තර සමූහයයි. ඒ බව,

".........මේ රට සියලු ආකාරයෙම ගිරි දුර්ග ආදියෙන් යුක්තය. අපගේ බලකොටු හැර අන්‍ය වූ ආරක්ෂක ස්ථානයක් විද්‍යාමාන වේ..........." (ම.ව. 74 : 27-30).

"..........නදී පර්වත දුර්ග ආදියෙන් යුක්ත වූ මේ ජනපදය සතුරු සෙනඟකට නිසි කලෙකත් දකින්ට හෝ නොදෙම්හ.........." (ම.ව. 75 : 31-33).

රුහුණේ තැන් තැන්වල පිහිටා තිබූ මෙම ගිරි දුර්ග රාශියට අමතරව එහි ඇතැම් ප්‍රදේශවල මහා වනාන්තර හා වන දුර්ග ද පිහිටා තිබිණ. පොළොන්නරු යුගයේදී පවා රෝහණ රාජ්‍යය මහා වනාන්තරයක්ව පැවති බව එකල එහි පාලකයා වූ මානාභරණ රජු විසින් කරන ලදැයි ප්‍රකාශයකින් හෙළිවන බව වංසකතාවේ සඳහන් වේ (ම.ව. 72 : 227). මේ වන දුර්ග රුහුණේ ස්වාධීනත්වය රැක ගැනීමෙහිලා මහත් පිටිබලයක් විය. මෙම ස්වාභාවික දුර්ගස්ථාන රෝහණ රාජ්‍යයට එරෙහිව විදේශික සතුරන්ගෙන් මෙන් ම අභ්‍යන්තර සතුරන්ගෙන් ද එල්ල වූ ආක්‍රමණවලට මුහුණ දීමේදී ඒවා කොතෙක් දුරට එහි පාලකයන්ට පිටිවහලක් හා ආක්‍රමණිකයන්ට එරෙහිව නැගී සිටි බාධකයන් වී දැයි ඉහත සඳහන් පාඨයෙන් පැහැදිලි වේ. එමෙන්ම මෙහි ඝන කැළෑ පැවතීමත් මාර්ග පටුවීමත් ප්‍රයෝජනයට ගනිමින් මාර්ග හරහා ගස් කපා හෙළීමෙන් ද සතුරාගේ ගමන අවහිර කිරීම් ද සිදු කර ඇත (කුලතුංග ටී.ජී, 2000, පි. 203) සුගලා බිසව සමග රෝහණයේදී රක්ඛ සේනාපතියාට මුහුණ දීමට සිදු වූ බලකොටු සටන් අතර කණ්ඨකවන නම් ස්ථානයේ කපා හෙළන ලද ගස්වලින් අවහිර කර තිබූ දුර්ගයන් ගැන සඳහන් වේ.

රෝහණ රාජ්‍යයේ පැවති ඓතිහාසික වටිනාකමත්, ආරක්ෂිත පරිසරයත්, එහි පැවති සමෘද්ධිමත්භාවයත්, ශ්‍රේෂ්ඨ රජවරුන්බිහිවීමත් යනාදි කරුණු මත ලංකා ඉතිහාසය තුළ රෝහණය සුවිශේෂී වේ. දේශීය රජවරුන්ගේ දේශපාලන කටයුතු සඳහා අවශ්‍ය වූ භූගෝලීය සාධක මෙන්ම භෞතික සාධක ද රෝහණ රාජ්‍යය සතුව පැවති බව මෙන්ම යුද කටයුතු සංවිධානය කිරීමේදී රෝහණ රාජ්‍යය මගින් සුවිශාල වූ දායකත්වයක් ලැබුණ බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

01. **මහාවංසය**, (2004), සුමංගල හිමි, ශ්‍රී හික්කඩුවේ, බටුවන්තුඩාවේ, (සංස්.)බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

02. **රාජාවලිය**, (1997), ඒ.වී. සුරවීර (සංස්), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

03. **සීහලවත්ථුප්පකරණය**, (1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (සංස්) අනුල මුද්‍රණාලය.

04. **සද්ධර්මාලංකාරය**, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම (සංස්), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

05. **වංසත්ථප්පකාසිනිය**, (1994), අමරවංශ හිමි, අකුරටියේ, දිසානායක හේමචන්ද්‍ර, (සංස්:) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

07. Epigraphia Zelanica, Volume II, Wickramasinghe, D.M.D. Z, Archaelogical Surver of Ceylon, Oxford University Press, London, 1928.

08. Epigraphia Zelanica, Volume III, Wickramasinghe, D.M.D. Z, Codrington, H,W,Archaelogical Surver of Ceylon, Oxford University Press, London, 1994.

09. Inscription of Ceylon, Vol. I, Paranavithana, senarath, Archaelogical Department, 1970

10. රණවැල්ල, සිරිමල්, (2003), **රෝහණ රාජ්‍යයේ ඉතිහාසය**, රුහුණු විශ්වවිද්‍යාලයේ ප්‍රකාශනයකි

11. කුලතුංග ටී.ජී, (2000), **මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධානය**, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

12. පරණවිතාන, සෙනරත්, (1972), **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, II භාගය**,විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, කැලණිය.